**මැතිවරණ නඩු...**

# මැතිවරණ නඩු පැවරීමේ බලය කොමිසමට දෙන්න

## නිරීක්ෂකයෝ කියති

රවිශාන් ප්‍රනාන්දු

▶ 02 පිටුවට

මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධව නඩු පැවරීමේ බලය මැතිවරණ කොමිසමට ලබාදිය යුතු බව 'පැෆරල්' සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා 'ඉරිදා මව්බිම'ට පැවැසීය.

නීති උල්ලංඝනයන් සිදුවන ප්‍රමාණයට සාපේක්ෂව නඩු පැවරීම්, තීන්දු ලබාදීම සඳහා දීර්ඝ කාලයක් ගතවීම නඩු කටයුතු බොහොමයක් අසාර්ථක වීමට හේතු වන හෙයින් එකී ප්‍රමාදය මඟහරවා ගැනීම සඳහා එම කොමිෂන් සභාවට නඩු පැවරීමේ බලය ලබාදිය යුතු බව හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

මැතිවරණ කොමිෂන් සභාවට නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකරණමය බලතල නොමැති වීම බරපතළ ගැටලුවක් බව ඔහු කීවේය.

මැතිවරණ නීති උල්ලංඝන පිළිබඳ නඩු පැවරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට ලබාදීම පිළිබඳ වාර්තාවක් 2022 වර්ෂයේදී 'පැෆරල්' සංවිධානය සකස් කළ බව හෙට්ටිආරච්චි මහතා අවධාරණය කළේය.

වර්තමානයේදී මැතිවරණ කොමිෂන් සභාවට නීතිපති දෙපාර්තමේන්තුව හරහා නීතිපති උපදෙස් අනුව කටයුතු කිරීමට සිදුවන බව ඔහු කීවේය.

උදාහරණයක් ලෙස මැතිවරණ වියදම් නියාමනයේදී කොමිෂන් සභාවට නඩු පැවරීමේ කිසිදු බලයක් ලබාදී නොමැති බවත් අපේක්ෂකයන් නීතිය නොසලකා හැරියහොත් ඒ පිළිබඳව කටයුතු කිරීමට බලය ලබාදී තිබෙන්නේ පොලිසියට බව හෙට්ටිආරච්චි මහතා අවධාරණය කළේය.

මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධ විමර්ශන සහ නඩු කටයුතු නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට සෘජුවම අදාළ වන බව හෙට්ටිආරච්චි මහතා වැඩිදුරටත් කීය. මේ අතර මැතිවරණ වියදම් නියාමනයට අදාළ කරුණු කඩිනමින් විසඳිය යුතු බව ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිසංස්කරණ සහ මැතිවරණ අධ්‍යයන ආයතනයේ (අයිරෙස්) විධායක අධ්‍යක්ෂ මංජුල ගජනායක මහතා 'ඉරිදා මව්බිම'ට පැවැසීය.

එක් මැතිවරණයකදී වරදක් කළ පුද්ගලයකු තවත් මැතිවරණයකට ඉදිරිපත් වීම වැළැක්වීමට මැතිවරණ වියදම් නියාමන පනතේ ඇති විධිවිධාන කඩිනම් කිරීම සම්බන්ධයෙන් කතිකාවතක් ඇති විය යුතු බව ගජනායක මහතා කීවේය.

මැතිවරණ කොමිෂන් සභාවට එම පනත අනුව වරදකදී ක්‍රියා කිරීමට බලයක් නොමැති බවත් එවැනි අවස්ථාවක පොලිසිය නීතිපති උපදෙස් ලබාගෙන එම කටයුතු කළ යුතු බවත් ඔහු කීවේය. එබැවින් පොලිසියටද ඒ සඳහා නිශ්චිත කාල සීමාවක් නොමැති වීම බරපතළ ගැටලුවක් බව හෙතෙම ප්‍රකාශ කළේය.

2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ප්‍රායෝගිකව යෙදවීමට අවශ්‍ය බොහෝ දෑ වහාම යළි සකස් යුතු බව ගජනායක මහතා අවධාරණය කළේය. මැතිවරණ කොමිෂන් සභාව ඒ සඳහා අනිත් පාර්ශ්ව වෙත සිදු කරන බලපෑම මෙහිදී ද තීරණාත්මක බව හෙතෙම පැවැසීය.

පසුගිය ජනාධිපතිවරණයේදී අපේක්ෂකයන් කිහිප දෙනෙක් නියමිත කාලයේදී සිය වියදම් වාර්තාවන් ලබාදී නොතිබුණු බවත් ඔවුන්ගේ දේශපාලන අයිතිය අහිමි කිරීමට හෝ පියවර ගැනීමට ඉක්මන් ක්‍රියාවලියක් වෙත අනිවාර්යයෙන් යා යුතු බවත් ගජනායක මහතා වැඩිදුරටත් සඳහන් කළේය.